ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 03 වන මට්ටම

අවසාන පරීක්ෂණය 2022/ 2023

රෝම නීතිය - LLU3303

කාලය - පැය තුන (03) යි.

දිනය : 2024 පෙබරවාරි 28 වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30

මුළු ප්‍රශ්න ගණන : 08

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.

1. "නීති පැනවීම ලිඛිතව සිදු කිරීම හේතු කොට ගෙන නීති ක්‍රමයක ඉතිහාසය තුළ අතිශය වැදගත් අවස්ථාවක් සනිටුහන් වේ: අලිඛිත වූ චාරිත්‍රානුකූල නීති වලට අමතරව වඩාත් පුළුල් අනුෂාංගයන් සහිත වූ නව නීති මූලාශ්‍රයක් එයින් ජනිත වේ."

   Mousourakis George, *Fundamentals of Roman Private Law* (Springer 2012)

   ඉහත ප්‍රකාශය අනුසාරයෙන් රෝම නීති ක්ෂේත්‍රය පෝෂණය කිරීමෙහිලා දායක වූ විවිධ නීති මූලාශ්‍රයන් විස්තර කරන්න.

   **(ලකුණු 20)**

2. 55 වියැති රෝම පුරවැසියකු වූ ලූකස්, අනුපිළිවෙලින් වයස අවුරුදු 14, 11 සහ 09 ක් වූ ලොකාරියෝ, ජූලියා, සහ සිල්වියස් ගේ පීතෘ මූලිකයා වේ. තමා මුහුණ පෑ මූල්‍යමය දුෂ්කරතා හේතුවෙන් ලූකස් 11 වියැති ජූලියා ව 40 වියැති ධනවත් වැන්දඹු පුරුෂයකු වූ ඔක්ටේවියස් හට විවාහ කර දුන්නේය. ඔක්ටේවියස් කුරිරු මිනිසකු බවට චෝදනා කරමින් ජූලියා මාස දෙකකට පසු තම දෙමාපිය නිවස වෙත ආපසු පැමිණියාය. නැවත ඔක්ටේවියස් වෙත නොගියහොත් තමා ඇයව වහල් භාවය සඳහා විකුණා දමන බවට

ලූකස් ජූලියා ට තර්ජනය කළේය. ඔක්ටේවියස් තම සොයුරියට කුරිරු අන්දමින් සැලකීම නිසා ඔහුගෙන් පලිගැනීමට සිතාගත් ජූලියා ගේ සොහොයුරන් වූ ලොතාරියෝ සහ සිල්වියස්, ඔක්ටේවියස් ගේ ගොවිපලට ගිනි තැබූහ. ලොතාරියෝට සහ සිල්වියස් ට ප්‍රමාණවත් ආහාර සහ ඇඳුම් ලබා නොදී, ශීත කාලයේ නිවසින් පිටත රඳවා තැබීමෙන් ලූකස් ඔවුන් දෙදෙනාට දඬුවම් කළේය.

රෝම නීතියේ පීතෘ බලය යන්න ඇසුරින් ඉහත අවස්ථාවන්හි උද්ගත වන නෛතික තත්වයන් සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

3. 'යම් මියගිය තැනැත්තකුගේ වත්කම් සහ වගකීම් එම තැනැත්තාගේ උරුම කරුවන් වෙත ලැබෙන්නේ කුමන ආකාරයකට ද යන්න රෝම අනුප්‍රාප්ති නීතිය මගින් ගෙන හැර දක්වයි.'

ඉහත ප්‍රකාශය ඇසුරින්, රෝම නීතිය මගින් හඳුනාගත් අනුප්‍රාප්ති ද්විත්වය අදාළ නෛතික මූලධර්ම සහ උචිත උදාහරණ දක්වමින් විස්තර කරන්න.

**(ලකුණු 20)**

4. පහත දැක්වෙන අවස්ථාවන්ට අදාළ වන නෛතික මූලධර්ම විමසන්න.

*Conferratio* චාරිත්‍රය සම්පූර්ණ කරමින් ටයිටස්, ඇල්බා සමග මානුස් විවාහයකට ඇතුලත් වූවේය. එම විවාහයෙන් ඔවුනට නිවුන් පුතුන් දෙදෙනෙක් සහ එක් දියණියක් වූහ. අවාසනාවන්ත ලෙස එම නිවුන් පුතුන් දෙදෙනා වයස අවුරුදු 10 දී මුහුදේ ගිලීමෙන් මියගියහ. පුතුන් දෙදෙනාගේ මරණය නිසා ඇතිවූ මානසික බලපෑම හේතුවෙන් ටයිටස් උමතු භාවයට පත් වූවේය. ඒ අතරවාරයේ, තම 06 හැවිරිදි දියණියගේ භාරකරු ලෙස පත් වීමට ඇති හැකියාව පිළිබඳව ඇල්බා සොයා බැලුවාය.. ඇල්බා තවදුරටත් විශ්වාස කළේ, තම රක්ෂිතයාගේ දේපල වල ආදායම ලබාගෙන, තමාට කැමති අයුරින් එය ආයෝජනය කිරීමට ඇයට හිමිකම ලැබෙන බවයි.

**(ලකුණු 20)**

5. පහත දැක්වෙන එක් එක් අවස්ථාවන්හි දී පාර්ශවයන්ට පවතින නෛතික ප්‍රතිකර්ම මොනවාදැයි සාකච්ඡා කරන්න.

   අ). එට්කාගේ පියාගෙන් තෑගි ලැබුණු ඉඩම් කැබැල්ලෙහි කුඩා නිවසක් ඉදි කිරීමට අලුත විවාහපත් යුවලක් වූ ජූනෝ සහ එට්කා තීරණය කළහ. ජූනෝ ගේ සොහොයුරා වූ ප්ලූටෝ, නිවසේ බිත්ති ගොඩනැගීමට අවශ්‍ය ගඩොල් තොගයක් සහ වැලි ලබා දුන්නේය. ඒ අතරතුර, තමාගේ ඉඩමෙහි ගොඩ ගසා තිබූ ගඩොල් සහ වැලි ප්ලූටෝ විසින් සොරකම් කල බවට අසල්වැසියකු වූ මාකස් පැමිණිලි කළේය. මේ අවස්ථාව වන විට නිවසේ බිත්ති ගොඩනැගීම සම්පූර්ණයෙන්ම නිම කර තිබූ බැවින් ජූනෝ සහ එට්කා දැඩි අපහසුතාවට පත් වූහ.

   ආ). ඇන්ටෝනියෝ ට අයිති ඉඩමෙහි රොමියුලස් පදිංචි වූවේය. වසර 5 ක ට පසුව ඇන්ටෝනියෝ රොමියුලස් ව ඉඩමෙන් පිටමං කරමින් නැවතත් එහි භුක්තිය ලබා ගත්තේය. කෙසේ වෙතත්, මාස 6 ක ට පසුව රොමියුලස් ඇන්ටෝනියෝ ව බලහත්කාරයෙන් ඉවත් කරමින් ඉඩමෙහි තිරිඟු සහ බාර්ලි වගා කළේ තමාට එම ඉඩම සම්බන්ධව කාලාවරෝධී අයිතිය ඇති බව දක්වමිනි.

**(ලකුණු 10x2=20)**

6. අ). ක්ලීටස් සහ පවුලේ අය මැසඩෝනියාවට වන්දනා චාරිකාවක් ගියහ. ඔවුන් බැහැරව සිටියදී ඔවුන්ගේ නිවස ගිනි ගැනීමට ලක්විය. ක්ලීටස් ගේ අසල්වැසියා වූ උර්බානෝ තම පුතුන්ගේ උපකාර ලබාගෙන එම ගින්න නිවීමට කටයුතු කළේය. ක්ලීටස්ගේ වහලා ගින්නෙන් දරුණු තුවාල ලැබූ අතර, ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වූ වියදම් උර්බානෝ ගෙව්වේය. තවද, ක්ලීටස් ගේ නිවසේ තිබූ තිරිඟු තව දුරටත් විනාශ වීම වැලැක්වීම සඳහා ඒවා අසුරා තැබීමට ගබඩා පහසුකම් ද උර්බානෝ කුලියට ගත්තේය.

   ඉහත දැක්වෙන අවස්ථාවන් හා සම්බන්ධ වූ නෛතික අනුෂාංගයන් පිළිබඳව ක්ලීටස් සහ උර්බානෝ ට උපදෙස් දෙන්න.

   ආ). 'රෝම නීතිය යටතේ එකඟතා ගිවිසුම් ආකෘතියක් රහිත වූ අතර , ද්විපාර්ශ්වික බැඳීම් උද්ගත කල හුදු එකඟතාවන් වේ.'

   උචිත උදාහරණ දක්වමින් රෝම නීතිය යටතේ එකඟතා ගිවිසුම්වල ස්වභාවය විස්තර කරන්න.

**(ලකුණු 10x2=20)**

7. පහත දැක්වෙන අවස්ථාවන්හි දී අදාළ වන රෝම නීති මූලධර්මයන් විශ්ලේෂණය කරන්න.

අ). සයිරස් රාත්‍රී කාලයේ ෆීලික්ස් ගේ නිවසට ඇතුළුවී, රත්‍රන් වලින් නිමැවූ අලංකාර බඳුන් කීපයක් සොරකම් කළේය. සොරාගත් භාණ්ඩ රැගෙන පිටවී යාමට ඔහු උත්සාහ කල අවස්ථාවේ, ෆීලික්ස්, තමාගේ වහලා වූ බැල්බස් ගේ සහාය ඇතිව සයිරස් ව අල්ලා ගත්තේය.

**(ලකුණු 06)**

ආ). විශාල තිරිඟු තොගයක් ගබඩා කර තිබූ හෙඩ්රියන් ගේ ගබඩාවට ජූලියස් ගිනි තැබුවේය. තමා එසේ කළේ හෙඩ්රියන් අසාධාරණ ලෙස ගොවියන්ට තර්ජනය කර එම තිරිඟු තොග රැස්කරගත් නිසා බව දක්වා තම ක්‍රියාව සාධාරණීකරණය කිරීමට ජූලියස් උත්සාහ කළේය.

**(ලකුණු 07)**

ඇ). අධික ලෙස වයින් පානය කිරීම නිසා මත්වී සිටි කැමිලස්, සෙනෙට් සභිකයකු වූ සිසෙරෝ ට පොදු රැස්වීමක දී නින්දා පරිභව කළේය. කැමිලස් ව පාලනය කිරීමට සිසෙරෝ උත්සාහ කල අවස්ථාවේ, සිසෙරෝ ගේ මැණියන් ගණිකාවක බව කියමින් කැමිලස් සිසෙරෝ වෙත කෙළ ගැසුවේය.

**(ලකුණු 07)**

**(මුළු ලකුණු 20)**

8. පහත දැක්වෙන දෑ පිළිබඳව සවිස්තරාත්මක සටහන් ලියන්න.

අ). සම්භාව්‍ය යුගය සහ රෝම නීතියේ සංවර්ධනය කෙරෙහි එහි වැදගත්කම.

ආ). රෝමානු නෛතික කාර්ය පටිපාටිය සහ ප්‍රයිටෝරියානු ප්‍රතිකර්ම.

**(ලකුණු 10x2=20)**

~~ හිමිකම් ඇවිරිණි~~